# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION


සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1049 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 23/06/2024<br>පැය 0915 |

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.06.22 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කොළඹ 14 ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 442 මිලිග්‍රෑම් 225 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.

2024.06.22 වන දින සවස් කාලයේ මීගමුව පොලිස් වසමේ දාගොන්න පාර ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - පොළොන්නරුව පොලිස් වසම.

2024.06.22 වන දින රාත්‍රී කාලයේදී පොළොන්නරුව පොලිස් වසමේ පරාක්‍රම සමුද්‍රය වැව් බැම්ම මතින් ලේක්විව් හන්දිය දෙසට ධාවනය කල යතුරුපැදියක්

පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන කොන්ක්‍රීට් ගලක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු පසුපැදිකරු හා යතුරුපැදියේ මැද ගමන් කල පිරිමි දරුවෙකු පොළොන්නරුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී යතුරුපැදියේ මැද ගමන් කල පිරිමි දරුවා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 12ක් වූ වැවපාර, නවනගරය ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**